**බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ**
**ජ්‍යෙෂ්ඨ විධායක සේවා සංණය සඳහා වන**
**බඳවා ගැනීමේ පරිපාටිය.**

**01. සම්බන්ධ වන ආයතන**

1.1 දෙපාර්තමේන්තුව : බන්ධනාගාර — යොමු අංකය :ඩී 8 /21//බ.පරි/ අභි.බ.කො.ජ. දිනය : 2014.03.19

1.2 අමාත්‍යාංශය : පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ — යොමු අංකය :MRPR/2/2/1-2 දිනය : 2014.04.03

1.3 කළමනාකරණ සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් තනතුරු අනුමත කිරීම : — යොමු අංකය : DMS/B2/48/01/Vol-II දිනය : 2013.09.24

1.4 ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ නිර්දේශය : — යොමු අංකය :EST-2/RECRU/05/4867 දිනය :2014.05.02

1.5.ජාතික වැටුප් කොමිෂන් සභාවේ නිර්දේශය : — යොමු අංකය :NCP/6/18/096/SR දිනය :2014.04.29

1.6 රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය : — යොමු අංකය : PSC/EST/02-01-18/03/2014 දිනය : 2014.08.26

**02. පත් කිරීම් බලධරයා** : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

**03. සේවා ගණය පිළිබඳ විස්තර**

3.1 සේවා ගණය : ජ්‍යෙෂ්ඨ විධායක

3.2 ශ්‍රේණි : විශේෂ

3.3 පැවරෙන කාර්ය භාරය පිළිබඳ පොදු නිර්වචනය :
බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙත පැවරි ඇති අභිමතාධාරි බලය අනුව ප්‍රතිපත්ති සම්පාදනය, විධායක හා තීරණ ගැනීමේ කාර්යය, දෙපාර්තමේන්තු නිලධාරීන්ට අදාළ කාර්යය භාරයේදී සහය වීම

3.4 කාර්යන් පැවරීම :

ශ්‍රේණිගතව කාර්යයන් පැවරීමක් සිදු නොකරන අතර, මෙම සේවා සංණයට පැවරෙන කාර්යයන් අතුරින් ඕනෑම කාර්යක් සේවයේ අවශ්‍යතාවය මත ජ්‍යෙෂ්ඨතාව හා කුසලතාව පදනම් කොටගෙන ඕනෑම ශ්‍රේණියක නිලධරයකුට දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලැබිය හැක.

**04. තනතුරෙහි / තනතුරේ ස්වභාවය** : ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත

**05. වැටුප්**

5.1 වැටුප් කේත අංකය : SL-3-2006

5.2 වැටුප් පරිමාණය : 42390-12X1310-58110

5.3 ශ්‍රේණි ක්‍රමයට අදාල ආරම්භක වැටුප් පියවර : 42390

| ශ්‍රේණිය | ආරම්භක වැටුප් පියවර | ආරම්භක වැටුප් තලය (රු) |
|---|---|---|
| විශේෂ | 01 | 42390 |

06. සේවා ගණයට අයත් තනතුර/තනතුරු

6.1 අනුමත තනතුරු නාම, අනුමත තනතුරු සංඛ්‍යාව හා ඒවාට පැවරෙන කාර්යයන් :

| අනුමත තනතුරු නාම | තනතුර අනුමත ශ්‍රේණිය | අනුමත තනතුරු සංඛ්‍යාව | කාර්යයන් |
|---|---|---|---|
| අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල් | විශේෂ | 01 | දෙපර්තමේන්තු ප්‍රධානියාට තිරණ ගැනීම සඳහා සහය වීම හා දෙපාර්තමේන්තු ප්‍රධාන විසින් පවරනු ලබන කාර්යය පිළිබඳ තිරණ ගැනීම |

6.2 නිලධර සංඛ්‍යාව : 01

07. බඳවාගැනීමේ ක්‍රමය

7.1 බඳවා ගන්නා ප්‍රතිශතයන් :

| ධාරාව | ප්‍රතිශතය |
|---|---|
| විවෘත | - |
| සීමිත | - |
| කුසලතා | 100% |

7.2 විවෘත බඳවා ගැනීම

7.2.1 බඳවා ගන්නා ශ්‍රේණිය : අදාල නොවේ.

7.3 සීමිත බඳවා ගැනීම

7.3.1 බඳවා ගන්නා ශ්‍රේණිය : අදාල නොවේ.

7.4 කුසලතා මත බඳවා ගැනීම

7.4.1 බඳවා ගන්නා ශ්‍රේණිය : විශේෂ

7.4.2 සුදුසුකම් :

7.4.2.1 අධ්‍යාපන සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ උපාධි ප්‍රධානය කිරීමේ ආයතනයක් වශයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගෙන ඇති ආයතනයකින් ක්ෂේත්‍රයට අදාළ පශ්චාත් උපාධියක් ලබා තිබීම.

7.4.2.2 වෘත්තිය සුදුසුකම් :

I. සහකාර බන්ධනාගාර අධිකාරීවරයෙකු ලෙස හෝ ඊට ඉහළ තනතුරක SL-01-2006 වැටුප් ඛාණ්ඩයේ තනතුරක වසර 18ක සේවා කාලයක් සපුරා ඇති බන්ධනාගාර කොමසාරිස් තනතුරට පත්වූ නිලධාරියෙකු විය යුතුය.

II. උසස් වීම සඳහා සුදුසුකම් ලබන දිනට බන්ධනාගාර කොමසාරිස් තනතුරේ ස්ථිර පදනම මත වසර පහ (05) ක සක්‍රිය හා සතුටුදායක සේවා කාලයක් සපුරා තිබීම හා වැටුප් වර්ධක 5ක් උපයාගෙන තිබීම.

III. සුදුසුකම් අපේක්ෂා කරන දිනට පූර්වාසන්න වසර 05 තුල සතුටුදායක හෝ ඉන් ඉහළ මට්ටමේ කාර්ය සාධනයක් සපුරා තිබීම හා වසර 05ක සතුටුදායක සේවා කාලයක් තිබීම

7.4.2.3 පළපුරුද්ද : අදාළ නොවේ

7.4.2.4 කායික සුදුසුකම් : අදාළ නොවේ

7.4.2.5 වෙනත් : තනතුරට බඳවා ගැනීම සඳහා 7.4.2.1 හා 7.4.2.2 දක්වා සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවන නිවේදනයේ/ ගැසට් පත්‍රයේ සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කළ යුතුය.

7.4.3 වයස : අදාළ නොවේ.

7.4.4 බඳවා ගැනීමේ ක්‍රමය :

7.4.4.1 ලිඛිත විභාගය : අදාළ නොවේ

7.4.4.2 වෘත්තිය පරීක්ෂණය : අදාළ නොවේ.

7.4.4.3 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය (ලකුණු ලබාදෙනු නොලැබේ.)
ඉටුකර ගැනීමට අපේක්ෂිත අරමුණු : අදාළ නොවේ.

7.4.4.3.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරනු ලබන බලධරයා : අදාළ නොවේ.

7.4.4.4. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය

| ලකුණු ලබාදෙනු ලබන ප්‍රධාන ශීර්ෂ | උපරිම ලකුණු ප්‍රමාණය | තෝරා ගැනීමට සලකා බලනු ලබන අවම ලකුණු ප්‍රමාණය |
|---|---|---|
| සේවා පළපුරුද්ද | 70 | |
| කුසලතාවය | 30 | |
| | 100 | අදාළ නොවේ. |

සටහන :-

I. ඉහත වගුවෙහි දැක්වෙන ලකුණු ලබා දෙන ප්‍රධාන ක්ෂේත්‍ර සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු ප්‍රමාණයන් ඇතුලත, එක් එක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය සඳහා විස්තරාත්මක ලකුණු පරිපාටියක් අනුමත කිරීම පත් කිරීම් බලධරයා විසින් සිදු කරනු ඇත.

II. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයෙන් ලබාගන්නා මුළු ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව හා පවතින පුරප්පාඩු සංඛ්‍යාව අනුව තනතුරට බඳවාගනු ලැබේ.

7.4.4.2.1. ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත්කරන බලධරයා : රාජ්‍ය සේවා කොමිෂන් සභාව

7.4.5 අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ ගැසට් පත්‍රයේ දැන්වීම් පළකිරීම හෝ ප්‍රසිද්ධ දැන්වීම් පළකිරීම හා වෙබ් අඩවියේ දැන්වීම් පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

08. කාර්යක්ෂමතා කඩඉම : අදාළ නොවේ.

09. භාෂා ප්‍රවීණතාවය : අදාළ නොවේ.

10. ශ්‍රේණි උසස් කිරීම : අදාළ නොවේ.

11. තනතුරු වලට පත් කිරීම. : අදාළ නොවේ.

12. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි වලට පරිබාහිර වන්නාවූ කොන්දේසි :
: අදාළ නොවේ.

13. රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්ය පටිපාටික රීතිවල දැක්වෙන අර්ථ නිරූපණ වලට පරිබාහිර වන්නාවූ අර්ථ නිරූපණ :
සක්‍රිය සේවා කාලය යනු ස්වකීය තනතුරට අදාල වැටුප් ලබමින් සත්‍ය වශයෙන්ම රාජකාරියෙහි යෙදී සිටි සේවා කාලය වේ. රජයෙන් අනුමත ප්‍රසූත නිවාඩු හැර අනෙකුත් සියළුම වැටුප් රහිත නිවාඩු කාල පරිච්ඡේදයන් සක්‍රිය සේවා කාලය සඳහා ගණනය කරනු නොලබන්නේය.

14. සෑම පත්වීමක් සම්බන්ධයෙන්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති අති විශේෂ ගැසට් පත්‍රයෙන් ප්‍රකාශිත කාර්ය පරිපාටික රීති වල දැක්වෙන පොදු කොන්දේසි සහ ආයතන සංග්‍රහයේ විධිවිධාන අදාල වේ.

15. මෙම බඳවාගැනීමේ පරිපාටියේ විධිවිධාන සලසා නොමැති යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධයෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් තීරණය කරනු ලැබේ.

සකස් කලේ : අත්සන : ..........................................

(විෂය භාර කණිෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ........ පී.ඩබ්ලිව්.යූ. අමරප්‍රේම

තනතුර : ........ පරිපාලන නිලධාරි (වැ.ආ.) බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට

දිනය : 2014.09. 04

පරීක්ෂා කලේ : අත්සන : ..........................................

(විෂය භාර ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධරයා)

නම : ........ එම්.බී.ආර්. පුෂ්පකුමාර

තනතුර : ........ බන්ධනාගාර කොමසාරිස් (ආයතන) බන්ධනාගාර කොමසාරිස් ජනරාල් වෙනුවට.

දිනය : 2014.09. 04

නිර්දේශ කර ඉදිරිපත් කරමි.

අත්සන : ..........................................

(දෙපාර්තමේන්තු ප්‍රධාන)

නම : ........ චන්ද්‍රරත්න පල්ලේගම

තනතුර : ........ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්

නිල මුද්‍රාව : ........ බන්ධනාගාර මූලස්ථානය, කොළඹ 09.

දිනය : 2014.09. 04

යොමු අංකය : MRPR/2/2/1-2

........ බන්ධනාගාර දෙපාර්තමේන්තුව ........ හි ........ අතිරේක බන්ධනාගාර ........ කොමසාරිස් ජනරාල් ........ තනතුර සඳහා යෝජිත මෙම බඳවා ගැනීමේ පටිපාටිය අනුමත කිරීම නිර්දේශ කරමි.

අත්සන : ..........................................

නම : ........ ජී. එස්. විතානගේ ........

ලේකම් අමාත්‍යාංශය

නිල මුද්‍රාව : ........ ජී.එස්. විතානගේ ලේකම් පුනරුත්ථාපන හා බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය 35 ඒ, ආචාර්ය එන්.එම්. පෙරේරා මාවත, බොරැල්ල, කොළඹ - 08.

දිනය : 2014.09. 26

---

යොමු අංකය : PSC/EST/02-D1-18/03/2014

........ බන්ධනාගාර දෙපාර්තමේන්තුව ........ හි ........ අතිරේක බන්ධනාගාර කොමසාරිස් ජනරාල් ........ තනතුර සඳහා වන මෙම බඳවා ගැනීමේ පටිපාටිය ........ 2014.08.26 ........ දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලදි.

අත්සන : ........ චන්ද්‍රා සේනාරත්න ........

නම : ..........................................

ලේකම්

රාජ්‍ය සේවා කොමිෂන් සභාව

දිනය : 2014.~~09~~ 10. 11.04

නිල මුද්‍රාව : ..........................................

ටී. එම්. එල්. සී. සේනාරත්න
ලේකම්
රාජ්‍ය සේවා කොමිෂන් සභාව
අංක. 177, නාවල පාර, නාරාහේන්පිට,
කොළඹ-05.